# ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ශිෂ්‍ය භට බලකායේ ප්‍රාථමික ශිල්පීය සේවා ශ්‍රේණිය (රියදුරු III) සඳහා බඳවා ගැනීම (විවෘත බඳවා ගැනීම) -2018

ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ශිෂ්‍ය භට බලකායේ ප්‍රාථමික ශිල්පීය සේවා ශ්‍රේණියේ රියදුරු තනතුරු පුරප්පාඩු 14 ක් පිරවීමට සුදුස්සන් තෝරා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් **2018.06.29** දිනට හෝ ඊට පෙර **ලේකම්, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය, 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ " **ජාතික ශිෂ්‍ය භට බලකායේ ප්‍රාථමික ශිල්පීය සේවා ශ්‍රේණිය - රියදුරු තනතුර සඳහා බඳවා ගැනීම 2018**" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

**01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය**

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක සහ වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

**02. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි**

ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතයි. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

**03. වැටුප් පරිමාණය**

PL-03-2016 -රු.25,790.00-10 X 270-10 X300- 10 X 330 - 12 X 350-රු.38,990.00
(2016/02/25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II අනුව වැටුප් ගෙවනු ලැබේ.)

**04. අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) කින් සමත් වීම.

**05. වෘත්තීය සුදුසුකම්**

i. පෞද්ගලික කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ වලංගු බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනකට පෙර අවම වශයෙන් C,C1 වාහන පන්තියේ රියදුරු බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රයට අනුව B පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)
ii. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

**06. පළපුරුද්ද**

රියදුරෙකු වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය.

**(රියදුරු බලපත්‍රයේ පිටපතක් හා සුදුසුකම් සනාථ කිරිම සඳහා සහතික වල පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතුය. )**

**07. කායික සුදුසුකම්**

i. අවම වශයෙන් උස අඩි 05ක් විය යුතුය.
ii. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු අතර දිවා කාලයේ හා රාත්‍රී කාලයේ සේවයේ යෙදීම පිණිස හා තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය. මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර එය රජයේ වෛද්‍ය නිලධාරියෙක් විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මඟින් සනාථ කළ යුතුය.

**08. වයස් සීමාව**

අයදුම් පත් භාර ගන්නා දිනට වයස අවු. 18ට නොඅඩු, උපරිම අවු. 45ට නොවැඩි විය යුතුය.

- දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**09. වෙනත් සුදුසුකම්**

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**10. බඳවා ගැනීමේ ක්‍රමය**

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන වෘත්තීය පරීක්ෂණ මණ්ඩලයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින්.

**වෘත්තීය පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ක්‍රමය**

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| රිය පැදවීම පිළිබඳ නිපුණත්වය | 40 | 20 |
| මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

➤ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ මූලික සුදුසුකම් පරීක්ෂා කරන අතර ඒ සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

**11.** (I) **ඉල්ලුම් පත්‍රය** සෙ.මී.22-29 ප්‍රමාණයේ A4 කඩදාසි වල සකස් කළ යුතු අතර,1-12 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද , 13 සිට අවසන් වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත්අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුණ හොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම් පත මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පතට අනුව සැකසිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

**සැලකිය යුතුය- රියදුරු බලපත්‍රයේ පිටපතක් හා සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික වල පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතුය.**

(II) රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා වල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත්‍ර එවිය යුතුය.

**12.** පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක කරන දිනය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන අතර ඇබෑර්තු සියල්ලම හෝ කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

**සුනිල් සමරවීර**
**ලේකම්**
**ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය**